# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Southern Province**

ඉහළ ඩික්සන් පාර, ගාල්ල. மேல் டிக்ஸன் வீதி, காலி Upper Dickson Road, Galle.


මගේ අංකය / எனது இல / My No } දප/අසං/12/ ක්‍රීඩා/2020
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2020.01.02

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
නි.අ.අ. / ස.අ.අ. ( සෞඛ්‍ය . ශාරිරික අධ්‍යාපන හා ක්‍රිඩා )
විදුහල්පතිවරුන් ,
ගුරු උපදේශක වරුන් ( සෞඛ්‍ය . ශාරිරික අධ්‍යාපන හා ක්‍රිඩා )

## දකුණු පළාත් පාසල් ක්‍රීඩා - 2020

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් ප්‍රගුණ කිරීම සඳහා 2016.12.19 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අංක ඊඩී/9/15/2/3/ පොදු යටතේ නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 34/2016 , 2018 .04.23 වන දින අධ්‍යාපන ලේකම්ගේ අංක ඊඩී/9/15/2/3පොදු චක්‍රලේඛ අංක 18/2018 සහ 2019.07.04 වන දින අධ්‍යාපන ලේකම්ගේ අංක ED/09/15/2/3 පොදු චක්‍රලේඛ අංක 34/2019 ට අනුව ඉදිරි පාසල් ක්‍රීඩා ප්‍රවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ. ඒ අනුව පාසල් ක්‍රීඩා තරග සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මීට පෙර නිකුත් කර ඇති සියළුම චක්‍රලේඛ අභිබවා 34/2016, 18/2018 හා 34/2019 චක්‍රලේඛවල අඩංගු උපදෙස් අනුව 2020 වසරේ පාසල් නිවාසාන්තර ක්‍රීඩා තරග , කොට්ඨාස ක්‍රීඩා තරග,කලාප ක්‍රීඩා තරග හා දකුණු පළාත් පාසල් ක්‍රීඩා තරග සංවිධානය කළ යුතු අතර එහිදී පහත උපදෙස් අනුවද කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

❖ **ක්‍රීඩා තරග පවත්වා අවසන් කළ යුතු දිනය.**

| නිවාසාන්තර ක්‍රීඩා තරග | කොට්ඨාස තරග | කලාප ක්‍රීඩා තරග |
|---|---|---|
| 2020 පෙබරවාරි 07 ට පෙර | 2020 පෙබරවාරි 29 ට පෙර | 2020 මාර්තු 17 දිනට පෙර |

- කලාප ක්‍රීඩා අයදුම්පත් 2020 අප්‍රේල් 06 දිනට පෙර දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අංශයට ලබාදිය යුතුය.
- වෛකල්පිත ක්‍රීඩා අයදුම්පත් 2020 පෙබරවාරි 29 දිනට පෙර දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අංශයට ලබාදිය යුතුය.

සැ.යු. - **සියලුම ඉල්ලුම් පත්‍ර නියමිත ආකෘති පත්‍රයන් පරිඝණක ගත කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් සහතික කර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අංශයට ලබාදිය යුතුය.**

i. මලල ක්‍රීඩා තරග ඉසව් හා කණ්ඩායම් තරග සඳහා කලාප තරගවලින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථානය ලැබූ ක්‍රීඩක/ ක්‍රිඩකාවන් සහ කණ්ඩායම් පමණක් දකුණු පළාත් තරග සඳහා ඉදිරිපත් කළ යුතුවේ. (මලල ක්‍රීඩා තරග වලදී කිසියම් ඉසව්වක මෙම ස්ථානයන් තුනෙන් දෙකක් ක්‍රීඩා පාසලක් හිමි කරගෙන ඇති විට පමණක් එම ඉසව්වේ සිව්වන ස්ථානය හිමි කරගනු ලබන ක්‍රීඩක/ ක්‍රීඩිකාව ද ඉදිරිපත් කළ හැක.)

ii. සමස්ත ලංකා / පළාත් මලල ක්‍රීඩා තරග සඳහා අභියාචනා භාර ගනු නොලැබේ. එසේ වුවද කලාප/පළාත් මට්ටමේ තරග පවත්වන දිනක අසනීපව රෝහල් ගත කිරීමට සිදු වුවහොත් ඇද ඉහපත අංකය සහිතව අදාළ රෝහල් බලධාරියාගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් හා ඊට පෙර ලබා ගත් තරග දක්ෂතා ඉදිරිපත් කල විට ඒ පිළිබඳව සලකා බලනු ලැබේ.

**iii.** සියලුම ඉල්ලුම්පත්‍ර ලබා දී ඇති ආදර්ශ ආකෘති පත්‍රයන් අනුව එක් එක් වයස් සීමාවන් හා බාලක/බාලිකා වෙන වෙන ම වන පරිදි සම්පූර්ණ කළ යුතුය. පාසල් වල නිවැරදි තැපැල් ලිපිනයන් හා ළමුන්ගේ නම් පැහැදිලිව සටහන් කළ යුතු අතර, මුලකුරු ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය යුතුය. (උදා. R.M.J.බෝසිළු ) ප්‍රමාදවී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

**iv.** මීටර් 1500 ට වැඩි ,අර්ධ මැරතන්,මී. 400 වැඩි පිහිණුම්,සටන්කලා, පාපන්දු, රගර්,පාපැදි, කරාතේ තරග වලට සහභාගිවන ක්‍රීඩක/ක්‍රීඩිකාවන් වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිට අදාළ වෛද්‍ය වාර්තා ලබාගත යුතුය.

v. කරාතේ,කබඩි,මල්ලවපොර,බොක්සිං,ජුඩෝ,ටයිකොන්ඩෝ සහ බර ඉසිලීම තරග අදාළ වයස්සීමා වල බර පන්ති අනුව තරග පැවැත්වේ.

❖ <u>මලල ක්‍රීඩා වයස් සීමා (බාලක/බාලිකා)</u>

- **12න් පහළ - (අවු.10ටවැඩි-අවු.12ටඅඩු) 2009 - 2010 වර්ෂ වල උපන් අය**
- **14න් පහළ - (අවු.12ටවැඩි-අවු.14ටඅඩු) 2007 - 2008 වර්ෂ වල උපන් අය**
- **16න් පහළ - (අවු.14ටවැඩි-අවු.16ටඅඩු) 2005 - 2006 වර්ෂ වල උපන් අය**
- **18න් පහළ - (අවු.16ටවැඩි-අවු.18ටඅඩු) 2003- 2004 වර්ෂ වල උපන් අය**
- **20න් පහළ - (අවු.18ටවැඩි-අවු.20ටඅඩු) 2001 - 2002 වර්ෂ වල උපන් අය**

❖ <u>කලාප මට්ටමින් පැවැත්වෙන ක්‍රීඩා තරග</u>

- වොලිබෝල් - බාලක/බාලිකා - 16 න් පහළ, 18 න් පහළ, 20 න් පහළ,
- නෙට්බෝල් -බාලිකා - 16 න් පහළ, 18 න් පහළ, 20 න් පහළ,
- එල්ලේ - බාලක/බාලිකා - 20 න් පහළ, (අවු.14ටවැඩි-අවු.20ටඅඩු )
- සැහැල්ලු පන්දු ක්‍රිකට් - බාලක/බාලිකා - 20 න් පහළ (අවු.14ටවැඩි-අවු.20ටඅඩු )
- පාපන්දු - බාලක - 16 න් පහළ, 18 න් පහළ, 20 න් පහළ
- පාපන්දු - බාලිකා - 20 න් පහළ (අවු.14ටවැඩි-අවු.20ටඅඩු )
- මලල ක්‍රීඩා තරග - බාලක/බාලිකා - 12/ 14/ 16/ 18/ 20 න් පහළ,
- කරාතේ - බාලක/බාලිකා - 16න් පහළ, 18 න් පහළ, 20න් පහළ

❖ **<u>පළාත් මට්ටමින් පැවැත්වෙන ක්‍රීඩා තරග</u>**

| | | |
|---|---|---|
| • චෙස් | - බාලක/බාලිකා | - 17/ 20 න් පහළ |
| • කරාතේ | - බාලක/බාලිකා | - 16/ 18 /20න් පහළ |
| • බැඩ්මින්ටන් | - බාලක/බාලිකා | - 17 /20 න් පහළ |
| • මේසපන්දු | - බාලක/බාලිකා | - 17 / 20 න් පහළ |
| • පිහිනුම් | - බාලක/බාලිකා | - 12 /14/16/18/20 න් පහළ |
| • ත්‍රෝබෝල් | - බාලක/බාලිකා | - 17 /20න් පහළ |
| • කැරම් | - බාලක/බාලිකා | - 17 /20න් පහළ |
| • ජිම්නාස්ටික් | - බාලක/බාලිකා | - 12/14 /16/18/20 න් පහළ |
| • ඇරොබික්ජිම්නාස්ටික් | - බාලක/බාලිකා | - 12 /14/16/18/20 න් පහළ |
| • රගර් (සත් සමාජික) | - බාලක | - 20 න් පහළ (අවු.16ට වැඩි-අවු.20ට අඩු ) |
| • කබඩි | - බාලක/බාලිකා | - 17 / 20 න් පහළ |
| • පැසිපන්දු | - බාලක/බාලිකා | - 17 /20 න් පහළ |
| • හොකී | - බාලක/බාලිකා | - 20 න් පහළ (අවු.14ට වැඩි-අවු.20ට අඩු ) |
| • ශාරීරික අභ්‍යාස | - බාලක/බාලිකා | - 20 න් පහළ (අවු.14ට වැඩි-අවු.20ට අඩු ) |

❖ **<u>සමස්ත ලංකා මට්ටමින් පැවැත්වෙන ක්‍රීඩා තරග</u>**

| | | |
|---|---|---|
| • ටෙනිස් | - බාලක/බාලිකා | - 17 /20 න් පහළ |
| • වෙරළ වොලිබෝල් | - බාලක/බාලිකා | - 20 න් පහළ (අවු.14ට වැඩි-අවු.20ට අඩු ) |
| • මල්ලවපොර | - බාලක | - 17 / 20 න් පහළ |
| • බොක්සිං | - බාලක | - 16/18 /20 න් පහළ |
| • බොක්සිං | - බාලිකා | - 18 න් පහළ(අවු: 16ට වැඩි - අවු: 20 ට අඩු ) |
| • ජුඩෝ | - බාලක/බාලිකා | - 20 න් පහළ (අවු.14ට වැඩි-අවු.20ට අඩු ) |
| • ටයිකොන්ඩෝ | - බාලක/බාලිකා | - 18/20 න් පහළ |
| • බර ඉසිලීම | - බාලක/බාලිකා | - 17/20 න් පහළ |
| • පාපැදි | -බාලක/බාලිකා | - 20 න් පහළ (අවු.16ට වැඩි-අවු.20ට අඩු ) |
| | -බාලක- | - කිලෝමීටර් 30 |
| | - බාලිකා | - කිලෝමීටර් 20 |
| • අර්ධ මැරතන් | - බාලක/බාලිකා | - 20 න් පහළ (අවු.16ට වැඩි-අවු.20ට අඩු ) |
| | -බාලක- | - කිලෝමීටර් 15 |
| | - බාලිකා | - කිලෝමීටර් 10 |

**<u>ක්‍රීඩා තරග සඳහා පොදු උපදෙස් මාලාව පහත පරිදි වේ.</u>**

1. නිවාසාන්තර/කොට්ඨාස/කලාප /පළාත් සහ ජාතික මට්ටමේ තරග සඳහා සහභාගී වන පාසල් ශිෂ්‍ය / ශිෂ්‍යාවන් තරග පැවැත්වෙන වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනයද ඇතුළත්ව එදිනට නියමිත වයස් සීමාව තුළ සිටිය යුතුය.

2. විවිධ ක්‍රීඩා සඳහා බලපාන සාමාන්‍ය නීතිරීති වලට අතිරේකව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පනවා ඇති නීතිරීති අනුව තරග පවත්වනු ලැබේ.

3.i. සෑම ක්‍රීඩක/ක්‍රීඩකාවකගේම වයස සනාථ කිරීම සඳහා විධිමත් උප්පැන්න සහතිකය පමණක් පිළිගනු ලැබේ. (දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික නොකළ ඡායා පිටපත් පිළිගනු නොලැබේ.) ජාතික මට්ටමේ තරගවල දී ක්‍රීඩක/ක්‍රීඩිකාවන් විසින් තම උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුවේ.

ii. ජාතික මට්ටමේ තරග වලට සහභාගී වන වයස අවුරුදු 18 ට වැඩි සියලුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත්කල හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කල යුතුය. වයස අවුරුදු 18 න් පහළ ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සඳහා පමණක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් නිකුත්කල හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ප්‍රමාණවත් ය.එම හැඳුනුම්පත් වලට අමතරව විදුහල්පති විසින් අදාළ වර්ෂය සඳහා සහතික කරන ලද අඟල් 2X2.5 ප්‍රමාණයේ ඡායා රූපයක් ද සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් ඉදිරිපත් කළ යුතුය.

iii. 12 න්,14න් පහළ අනන්‍යතාවය සඳහා සහතික කරන ලද අඟල් 2X2.5 ප්‍රමාණයේ ඡායා රූපයක් සියලුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් ඉදිරිපත් කළ යුතුය. ඡායා රූපය සහතික කිරීමේදී ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ නම, උපන් දිනය, උප්පැන්න සහතික අංකය, ඇතුලත්වීමේ අංකය සහ ඉගෙනුම ලබන ශ්‍රේණිය ඇතුළත් විය යුතුය.

4. i.ක්‍රීඩා වලට සම්බන්ධ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විවිධ හේතූන් මත වෙනත් විද්‍යාලයකට ඇතුළත් වීමෙන් පසු එම ඇතුළත් වූ දිනයේ සිට වසරක් ගතවන තෙක් නව විද්‍යාලය යටතේ ක්‍රීඩා තරග වලට ඉදිරිපත්විය නොහැක. එසේ ඉදිරිපත් වීමට අවශ්‍ය වන්නේ නම් ඔහු/ඇය දැනට ඉගෙනුම ලබන නව විද්‍යාලය යටතේ ක්‍රීඩා වලට ඉදිරිපත් වීමට විරුද්ධත්වයක් නොමැති බවට තමා එම වසරට කලින් ඉගෙන ගත් සියළුම පාසල් වල විදුහල්පතිවරුන්ගෙන් ලිඛිත අවසරයක් ලබා ගත යුතුය.එසේ අවසර ලබා ගත් ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට නව පාසල නියෝජනය කරමින් ක්‍රීඩා තරග වලට සහභාගී වීමට හිමිකම ඇත. 6 වන ශ්‍රේණියට සහ 12 වන ශ්‍රේණියට ඇතුළත් වන සිසුන්ට මෙම නීතිය බල නොපැවැත්වේ.

ii.කිසියම් ශිෂ්‍යයකු /ශිෂ්‍යාවකට එක් වර්ෂයකදී එක් තරගාවලියක් නියෝජනය කළ හැක්කේ එක් පාසලකින් පමණි ඒ අනුව යම් ක්‍රීඩකයකු/ක්‍රීඩිකාවක කලාප තරග සඳහා පෙනී සිටි පාසලෙන් ඉවත්වී ගියහොත් එම වර්ෂයේ ඉදිරි තරග ද (පළාත් /සමස්ත ලංකා) තම මුල් පාසල නියෝජනය කරමින් ඉදිරිපත් විය යුතුය.

iii.එසේ වුවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත ශ්‍රී ලංකා පාසල් සංගම් ,ජාතික සංගම් මගින් පවත්වන වෙනත් තරගාවලි සඳහා නව පාසල නියෝජනය කල හැක.එහිදී ඉහත 4.i අනුව මුල් පාසලේ,පාසල් වල විදුහල්පති/විදුහල්පතිවරුන්ගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය.

5. පාසල් හැරගිය සිසුන්ටද විශ්ව විද්‍යාලයකට හෝ සන්නද්ධ සේවාවන්ට ඇතුළත්ව ජාතික මට්ටම් තරග වලට සහභාගී වූවන්ට ද මෙම පාසල් ක්‍රීඩා තරග සඳහා සහභාගී විය නොහැක.

6. ක්‍රීඩක/ ක්‍රීඩකාවන් නියමිත දිනවල පෙ.ව.8.00 වන විට ඔවුන් අයත් පාසලේ ගුරු මහතෙකු/ මහත්මියකු භාරයේ අදාල ක්‍රීඩාංගනයේ තරග සම්බන්ධීකරණ නිලධාරියා වෙත වාර්තා කල යුතුය. එසේ නියමිත වෙලාවට වාර්තා නොකරන ක්‍රීඩක/ ක්‍රීඩකාවන්ට තරග සඳහා සහභාගිවීමට අවස්ථාව නොලැබෙන බව අවධාරණය කරමි.

7. සෑම ක්‍රීඩක/ ක්‍රීඩකාවක්ම ඒ ඒ ක්‍රීඩාවන් සඳහා උචිත ඇඳුමෙන් සහභාගි විය යුතු වන අතර විනය ඉතා උසස් තත්වයක පවත්වා ගනිමින් ක්‍රීඩා තරග සඳහා සහභාගිවිය යුතුවේ. වෙනත් කිසිදු බාහිර පුද්ගලයන් කැටුව ඒමෙන් වැළකිය යුතුය.

8. ක්‍රීඩක/ ක්‍රීඩකාවන් සඳහා නේවාසික පහසුකම්අවශ්‍යය වන අවස්ථාවන්හිදී ඔවුන් අයත් පාසලේ ගුරු මහතෙකු/ මහත්මියකු භාරයේම සිටිය යුතු අතර තම බඩු බාහිරාදිය පිළිබඳව ද ඔවුන්ගේ විනය හා පාසලේ ගරුත්වය රැක ගැනීමටද කටයුතු කල යුතු බවත්, සම්පූර්ණ කාලයම තම දරුවන් සමග රැඳී සිටිය යුතු බවද තරයේම තම කණ්ඩායම් භාරව පැමිණෙන ගුරු භවතුන් දැනුවත් කරන ලෙස අදාල විදුහල්පතිවරුන් වෙත ඉතා කාරුණිකව දන්වමි.

9. ක්‍රීඩා තරග සඳහා පාසල් ළමුන් සහභාගී කරවීමේ දි ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ ඊඩී/1/15/2/1/46 අංක හා 2013.03.19 දිනැති ලිපිය අනුව නිවාසාන්තර ක්‍රීඩා තරග වල අර්ධ මැරතන්,ගම හරහා දිවීම තරග "පාසල් ක්‍රීඩා තරග උපදෙස් පත්‍රිකාව " අනුව ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කල යුතු වේ.

10. **පළාත් තරග සම්බන්ධයෙන් මීට අමතර කිසිදු දැනුම් දීමක් සිදු කරනු නොලැබේ.මෙහි සඳහන් කර ඇති දින වලදී අදාළ තරග පැවැත්වෙන අතර ඒ සඳහා ඔබ විද්‍යාලයේ /කලාපයේ ජයග්‍රහණය කළ සහ ඉදිරිපත් වන කණ්ඩායම් හා ක්‍රීඩක / ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම විදුහල්පති /කොට්ඨාස/කලාප නිලධාරීන් සතු වගකීමක් වේ.**
11. තරග සඳහා නේවාසික ස්ථාන අවශ්‍ය වන්නේ නම් අදාළ තරග දිනට සතියකට පෙර ඒ බව දුරකතන අංක 0912246631 වෙත වහාම දැනුම් දෙන්න.
12. මෙම උපදෙස් මාලාවේ ඇතුළත් නොවන කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සතුවේ.
13. **මෙම උපදෙස් පත්‍රිකාව පාසලට ලැබුන බවට විදුහල්පති විසින් ලොග් සටහනක් තබා අදාල සියළු පාර්ශවයන් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන්න**

.............................................................................

ආර්.එම්. ක්‍රිෂාන් දුමින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,

..............................................

දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
දකුණු පළාත් අධ්‍යාපනදෙපාර්තමේන්තුව,
ගාල්ල.

**පිටපත්**

01.දකුණු පළාත් අධ්‍යාපන ලේකම් - දැ.ගැ.පි.

02.අතිරේක ලේකම් ( අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) අධ්‍යාපන අමාත්‍යාංශය - දැ.ගැ.පි.

03. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) - දැ.ගැ.පි.

04.අධ්‍යාපන අධ්‍යක්ෂ(ශා.අ./ක්‍රිඩා )අධ්‍යාපන අමාත්‍යාංශය - දැ.ගැ.පි.

05.ගණකාධිකාරී දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි. සහ අ.ක.ස.

06.දකුණු පළාත් සැලසුම් අධ්‍යක්ෂ - දැ.ගැ.පි. සහ අ.ක.ස.

❖ <u>දකුණු පළාත් මට්ටමෙන් පැවැත්වෙන ක්‍රීඩා තරග සහ දිනයන් - 2020</u>

| ක්‍රීඩාව | පවත්වන දිනයන් | ස්ථානය |
|---|---|---|
| <u>මේසපන්දු තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **මාර්තු 7** - 17/20 න් පහළ බාලිකා තරග<br>**මාර්තු 8** -17/20 න් පහළ බාලක තරග | ගා/ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ |
| <u>කැරම් තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **මාර්තු 7 ,8**<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් මාර්තු 07 වන දින පෙ.ව. 8.00 ට තරග සඳහා වාර්තා කළ යුතුය. | ගා/ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ |
| <u>චෙස් තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **මාර්තු 13,14,15**<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් **මාර්තු 13** වන දින **ප.ව.12.30**ට තරග සඳහා වාර්තා කල යුතුය | ගා/ධර්මාශෝක විද්‍යාලය අම්බලන්ගොඩ |
| <u>බැඩ්මින්ටන් තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **මාර්තු 14 - 17/20 න් පහළ** බාලක තරග<br>**මාර්තු 15 - 17/20** න් පහළ බාලිකා තරග<br>**මාර්තු 16 - ඉතිරි තරග** | ගා/ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ. |
| <u>හොකී තරග</u><br>20 න් පහළ (අවු.14 ට වැඩි - අවු.20 ට අඩු ) | **අප්‍රේල් 4,5**<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් අප්‍රේල් 4 වන දින පෙ.ව.8.00 ට අදාල ක්‍රීඩාංගණයට වාර්තා කළ යුතුය. | බද්දේගම ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණය |
| <u>කබඩි තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **අප්‍රේල් 04** – 17/20 න් පහල බාලිකා තරග<br>**අප්‍රේල් 05** –17/ 20 න් පහල බාලක තරග | බද්දේගම මහජන ක්‍රීඩාංගණය (කුම්මේ) |
| <u>බාස්කට් බෝල් තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **අප්‍රේල් 24** – 17/20 න් පහළ බාලක තරග<br>**අප්‍රේල් 25** - 17/20 න් පහළ බාලිකා තරග<br>**අප්‍රේල් 26 - ඉතිරි තරග** | ගා/ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ |
| <u>ශාරීරික අභ්‍යාස</u><br>20 න් පහළ (අවු:14 ට වැඩි - අවු:20 ට අඩු) | **අප්‍රේල් 27 ,28**<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් අප්‍රේල් 27 වන දින පෙ.ව.8.00 ට තරග සඳහා වාර්තා කළ යුතුය. | ද.ප.පාසල් ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානය, කොටුව,ගාල්ල |
| <u>ත්‍රෝබෝල් තරග</u><br>17 න් පහළ (අවු.14 ට වැඩි - අවු.17 ට අඩු )<br>20 න් පහළ (අවු.17 ට වැඩි - අවු.20 ට අඩු ) | **අප්‍රේල් 29** - 17 /20 න් පහළ බාලක තරග<br>**අප්‍රේල් 30** - 17 /20 න් පහළ බාලිකා තරග | ද.ප.පාසල් ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානය, කොටුව,ගාල්ල |
| <u>පිහිනුම් තරග</u><br>12 න් පහළ (අවු.10 ට වැඩි - අවු.12 ට අඩු )<br>14 න් පහළ (අවු.12 ට වැඩි - අවු.14 ට අඩු )<br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු )<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි - 4,5,6**<br>**සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් තමන්ගේ පාසල වෙත ලබා දී ඇති තරග වැඩසටහනට අනුව අදාල දිනවල පෙ.ව.8.00 ට තරග වලට වාර්තා කළ යුතුය.** | සුගතදාස පිහිණුම් තටාකය කොළඹ |
| <u>වෙරළ වොලිබෝල්</u><br>20 න් පහළ (අවු.14 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි 11 ,12**<br>සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් මැයි **11** දින පෙ.ව.8.00 ට තරග සඳහා වාර්තා කළ යුතුය | හම්බන්තොට වෙරළ ක්‍රීඩා උද්‍යාංගණය |
| <u>නෙට්බෝල් තරග</u><br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු )<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | මැයි **13** - 16 න් පහළ බාලිකා<br>මැයි **14** - 18 න් පහළ බාලිකා<br>මැයි **15** - 20 න් පහළ බාලිකා | මාතර උයන්වත්ත ක්‍රීඩාංගනය |

| | | |
|---|---|---|
| **ජිම්නාස්ටික් තරග (කනිෂ්ඨ)**<br>12 න් පහළ (අවු.10 ට වැඩි - අවු.12 ට අඩු )<br>14 න් පහළ (අවු.12 ට වැඩි - අවු.14 ට අඩු ) | **මැයි 16 -** බාලක/බාලිකා තරග<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් පෙ.ව. 8.00 ට වන විට තරග සඳහා වාර්තා කළ යුතුය. | මාර/වැලිගම සිද්ධාර්ථ බාලක.විද්‍යාලය, වැලිගම |
| **ජිම්නාස්ටික් තරග (ජ්‍යෙෂ්ඨ)**<br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු )<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි 17 -** බාලක/බාලිකා තරග<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් පෙ.ව. 8.00 ට වන විට තරග සඳහා වාර්තා කළ යුතුය. | මාර/වැලිගම සිද්ධාර්ථ බාලක.විද්‍යාලය, වැලිගම |
| **සැහැල්ලු පන්දු ක්‍රිකට් තරග**<br>20 න් පහළ (අවු.14 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි 20** - බාලක තරග<br>**මැයි 21** - බාලිකා තරග<br>**මැයි 22** - ඉතිරි තරග | මාතර උයන්වත්ත ක්‍රීඩාංගනය |
| **ඇරොබික් ජිම්නාස්ටික් තරග (කනිෂ්ඨ)**<br>12 න් පහළ (අවු.10 ට වැඩි - අවු.12 ට අඩු )<br>14 න් පහළ (අවු.12 ට වැඩි - අවු.14 ට අඩු ) | **මැයි 21-** බාලක/බාලිකා තරග<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් පෙ.ව. 8.00 ට වන විට තරග සඳහා වාර්තා කළ යුතුය. | රිච්මන්ඩ් විද්‍යාලය,ගාල්ල |
| **ඇරොබික් ජිම්නාස්ටික් තරග (ජ්‍යෙෂ්ඨ)**<br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු )<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි 22 -** බාලක/බාලිකා තරග<br>සියළුම ක්‍රීඩක/ක්‍රීඩිකාවන් පෙ.ව. 8.00 ට වන විට තරග සඳහා වාර්තා කළ යුතුය. | රිච්මන්ඩ් විද්‍යාලය,ගාල්ල |
| **එල්ලේ තරග**<br>20 න් පහළ (අවු.14 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි 27** - බාලක තරග<br>**මැයි 28** - බාලිකා තරග<br>**මැයි 29** - ඉතිරි තරග | මාතර උයන්වත්ත ක්‍රීඩාංගනය |
| **පාපන්දු තරග**<br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු ) | **මැයි 27** - 16 න් පහළ බාලක තරග<br>**මැයි 28** - 18 න් පහළ බාලක තරග | මාතර උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනය. |
| **පාපන්දු තරග (ජ්‍යෙෂ්ඨ)**<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | **මැයි 29** - 20 න් පහළ බාලක තරග<br>**මැයි 30** - 20 න් පහළ බාලිකා තරග | බද්දේගම ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණය |
| **වොලිබෝල් තරග**<br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු )<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | **ජුනි 01** - 16 /20 න් පහළ බාලක<br>**ජුනි 02** - 18 න් පහළ බාලක<br>**ජුනි 03-** 16 /18 න් පහළ බාලිකා<br>**ජුනි 04** - 20 න් පහළ බාලිකා | දික්වැල්ල විජිත විද්‍යාලයීය ක්‍රීඩාංගණය |
| **කරාතේ තරග**<br>16 න් පහළ (අවු.14 ට වැඩි - අවු.16 ට අඩු )<br>18 න් පහළ (අවු.16 ට වැඩි - අවු.18 ට අඩු )<br>20 න් පහළ (අවු.18 ට වැඩි - අවු.20 ට අඩු ) | **ජුනි 06 –** 16/18/20 න් පහළ කාතා තරග සහ කණ්ඩායම් කාතා තරග ( බාලක/බාලිකා)<br>**ජුනි 07 –** 16 න් පහළ බාලක /බාලිකා කුමිතේ තරග<br>**ජුනි 08 -** 18 න් පහළ බාලක/ බාලිකා කුමිතේ තරග<br>**ජුනි 09 -** 20 න් පහළ බාලක/ බාලිකා කුමිතේ තරග සහ කණ්ඩායම් කුමිතේ තරග(බාලක/බාලිකා) | ගා/ ශ්‍රී සුමංගල විද්‍යාලය, හික්කඩුව |
| **මලල ක්‍රීඩා තරග**<br>(වයස අවුරුදු 12 / 14/ 16/ 18/ 20 න් පහළ)<br>(බාලක / බාලිකා) | **ජුනි 16,17,18,19** | කොළඹ සුගතදාස මලල ක්‍රීඩා ක්‍රීඩාංගණය හෝ මාතර උයන්වත්ත ක්‍රීඩාංගණය |

.........................................

ආර්.එම්. ක්‍රිෂාන් දුමින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,

.........................................
නිමල් දිසානායක
දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ